## 01 ආලත්ති යන වචනය පිළිබඳ නිර්වචන

දෙවියන්ට ''ආලය ඇත්ති'' යන අරුතින් ''ආල ඇත්තී'' යන්න ''ආලත්තී'' යනුවෙන් භාවිතයට පත් වී ඇත. ආලත්ති යන පදය දෙමළ භාෂාවෙන් ''අරත්තී'' යනුවෙන් ද, සංස්කෘත භාෂාවෙන් ''ආරතී'' යනුවෙන් ද භාවිත වේ. එම පද දෙක එකතු වීමෙන් 'ආලත්තී' යන පදය සෑදී ඇති බව පෙනේ. එසේම 'බැම'යන පදයට ගෞරව පිණිස මෙම යෙදුම යොදා ගෙන ඇත. 'බැම' යනු සෙමෙන් යන අර්ථය සඳහාත්, ගෞරවය සඳහාත් භාවිත කරන්නකි. සිංහල ශබ්දකෝෂ ග්‍රන්ථයෙහි මෙම වචනය පිළිබඳ විවිධ අර්ථකථනයන් සඳහන් වන අතර එහි අන්තර්ගත තොරතුරු මෙහිලා වැදගත් වේ.

ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂයෙහි දැක්වෙන පරිදි ආලත්ති යනු දේවාල ද, ප්‍රභූන් ද ඉදිරියේ ආශීර්වාද හෝ ගෞරව පිණිස වනනු ලබන දැල්වූ පහන් ගෙන දළදා මාලිගාවේ හා දේවාලවල කරන පූජාවක් [1] යනුවෙන් එක් අදහසක් ලෙස එහි ඉදිරිපත් කරයි. මෙහි ආලත්ති අම්මා යන්න ආලත්ති බැම කරන කාන්තාව, ආලත්ති සේවයේ නියුතු කාන්තාව නමින් හැඳින්වේ. එසේම ආලත්ති බැම ලෙස දැල්වූ පහන් කරකවා වැනීමෙන් ගෞරව කරනවා, ආලත්ති තේවාව පවත්වනවා, අත්පා මෙහෙවර කරනවා, ආදර සංග්‍රහ පවත්වනවා යනුවෙන් අදහස් කිහිපයක් එහි ඉදිරිපත් වේ.

ශ්‍රී සුමංගල ශබ්දකෝෂයට අනුව පෙහැරවල ගරු කටයුත්තන් ඉදිරියේ ආශීර්වාද කරමින් වැනු තෙල් පහන් කහදියර, කසාවත, අහර පිඬු යන ද්‍රව්‍ය රජු යන ට දෙපස සිට කතුන් කියන ආශීර්වාද පූජාව, මෙහෙය, ආගන්තු සත්කාරය [2] යනුවෙන් ආලත්ති ශබ්දයට අර්ථ දක්වයි. ආලත්ති අම්මා යනු ආලත්ති බැම කරන ස්ත්‍රීහු, රජු යන විට ආවඩන ස්ත්‍රීහු බවද, ආලත්ති බැම යනු දේවාලද්වාරයෙහි ස්ත්‍රීන් සිටගෙන තෙල් පහන් වනමින් ආයුබෝවේවායි කියමින් කරන පූජාව යනුවෙන් ද එහි විස්තර කෙරේ.

සිංහල විශ්වකෝෂයෙහි ආලත්ති යනුවෙන් සඳහන් වන්නේ දේවාල වල හෝ මාලිගාවල ඉදිරියෙහි ගෞරව පිණිස දල්වා ආශීර්වාද වශයෙන් වනන පහන, තේවාව සම්බන්ධ පූජා විධියකි. සුදු වස්ත්‍රයෙන් සැරසී සුවඳ කුරු අතින් ගත් ස්ත්‍රීන් දේවාල හා දළදා මාලිගයේ ගර්භද්වාර ඉදිරියෙහි දල්වන ලද පහන් වනමින් සිදු කරන කාර්යය වේ. ආශිර්වාද කිරීම,ආ වැඩීම, අත්පා මොහෙවර කිරීම, ආදර සංග්‍රහ දැක්වීම ආදිය සඳහා ද ආලත්ති වැනීම සිදු කෙරේ.[3]

---

1. ප්‍රායෝගික සිංහල ශබ්දකොෂය, I වන කාණ්ඩය අධිනීතිඥ හරිස්චන්ද්‍ර විජේතුංග,සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,1982, 226 පිටුව.

2. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, වැලිවිටියේ පන්ඩිත සොරත හිමි, එස්. ගොඩගේ සහ සහොදරයෝ, කොළඹ 10, 1999, 736 පිටුව.

3. සිංහල විශ්වකෝෂය, II වන කාණ්ඩය, මහාචාර්ය ඩී.ඊ. හෙට්ටිආරච්චි, සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1998, 663 පිටුව.